මගේ අංකය සීපීසී/සීඑස්/01/27/01/02-06
ප්‍රධාන ලේකම් කාර්යාලය,
මධ්‍යම පළාත.
2023.11.30

**ප්‍රධාන ලේකම් චක්‍රලේඛ - 03/2023**

ආණ්ඩුකාර ලේකම්,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සභා ලේකම්,
සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,
මධ්‍යම පළාත් සභාවේ සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

**මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ අනුමත තනතුරු සඳහා බඳවා ගැනීමට පවත්වන සම්මුඛ පරීක්ෂණ වල බඳවා ගැනීම් සිදු කරන අවස්ථාවලදී ඊට අදාළ අධ්‍යාපන සුදුසුකම් පරීක්ෂා කිරීම සම්බන්ධවයි.**

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ විවිධ තනතුරු සඳහා මේ වන විට ස්ථිර පත්වීම් ලබා ඇති නිලධාරීන් / සේවකයින් එහි බඳවා ගැනීම් සඳහා පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩල පරීක්ෂණ සඳහා ඉදිරිපත් කර ඇති අධ්‍යාපන සහතික ව්‍යාජ සහතික බවට පසුව සනාථ වීම හා සම්මුඛ පරීක්ෂණ මණ්ඩල විසින් වෛකල්පිත විෂයන්ට අදාල ප්‍රතිඵල ද මූලික අධ්‍යාපන සුදුසුකම් සලකා බැලීමේදී අදාල කරගෙන තිබීම හේතුවෙන් විවිධ ගැටළු පැන නැගී ඇත.

02. එබැවින් ඉදිරියේදී ගැටළු ඇති වීම වලක්වා ගැනීම සඳහා පහත සඳහන් පරිදි කටයුතු කළ යුතු වේ.

1) බඳවා ගනු ලබන තනතුරට අදාල මූලික අධ්‍යාපන සුදුසුකම් ලෙස අ.පො.ස (සා.පෙළ) හා අ.පො.ස (උ.පෙළ) විභාග ප්‍රතිඵල පරීක්ෂා කරන්නේ නම් ඒ සඳහා විභාග දෙපාර්තමේන්තුව මගින් හෝ නිකුත් කරනු ලබන ප්‍රතිඵල ලේඛනය පමණක් ඉදිරිපත් කල යුතු බවට අයදුම්කරුවන් දැනුවත් කිරීම.
2) යම් අයදුම්කරුවෙකු නොවැළැක්විය හැකි හේතුවක් මත සම්මුඛ පරීක්ෂණය සඳහා පාසල මගින් නිකුත් කරනු ලබන අධ්‍යාපන සහතික් ඉදිරිපත් කලහොත් පත්වීම් ලබා දීමට පෙර විභාග දෙපාර්තමේන්තුවේ සහතිකය ඉදිරිපත් කිරීම අත්‍යාවශ්‍ය බවට දැනුම් දීම හා එසේ ඉදිරිපත් නොකිරීම පත්වීම ලැබීමට නුසුදුස්සෙකු ලෙස සලකන බවට දැනුවත් කිරීම.
3) අනුමත සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීමේ පරිපාටිවල අ.පො.ස(සා.පෙළ) විභාගයේ සුදුසුකම් පරීක්ෂාවේදී වෛකල්පිත විෂයයන් හර විෂයන් ලෙස සලකා කටයුතු නොකරන ලෙස සම්මුඛ පරීක්ෂණ මණ්ඩල දැනුවත් කිරීම.
4) අදාල නිලධාරියා / සේවකයා බඳවා ගැනීමෙන් පසුව සේවය ස්ථිර කිරීම සඳහා වසර තුනක පරිවාස කාලයට යටත් වුවත්, බඳවා ගත් දින සිට අවම වශයෙන් වසරක කාල සීමාවක් ඇතුලත විභාග දෙපාර්තමේන්තුවෙන් හෝ අදාල ආයතනයෙන් වලින් ඉදිරිපත් කර ඇති ප්‍රතිඵල සනාථ කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.
5) එසේ ප්‍රතිඵල සනාථ කර ගැනීමේදී ව්‍යාජ සහතික පත්‍ර බව අනාවරණයක් සිදු වුවහොත් එම අවස්ථාවේදී ම අවශ්‍ය විනය ක්‍රියාමාර්ග ගැනීම හා නොපමාව ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කිරීම.

03.ඒ අනුව ඉහත දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් ඔබගේ පෞද්ගලික අවධානය යොමු කරන ලෙසත්, ඔබ අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව/ ආයතනය යටතේ සිටින සියලුම මාණ්ඩලික නිලධාරීන් හා විෂය නිලධාරීන් දැනුවත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස දන්වා සිටිමි.

ජී.එච්.එම්.ඒ.ප්‍රේමසිංහ,
ප්‍රධාන ලේකම්,
මධ්‍යම පළාත.